**කැලෑ දෙපාර්තමේන්තු අරමුදල - 2015**

---------------------------------------------

කැලෑ දෙපාර්තමේන්තු අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන කැලෑ ආඥා පනතේ (451 අධිකාරිය) 64 වගන්තිය යටතේ සාදනු ලැබූ රෙගුලාසිවල අංක 10-ඊ දරන නියෝගය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත්කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන් වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

-----------------

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කැලෑ දෙපාර්තමේන්තු අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

**2.2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** අවසන් වූ වන අපරාධ නඩුවලට අදාළ දඩ මුදල් අධිකරණ මඟින් අරමුදලට ප්‍රේෂණය කර තිබුණද එයට අදාලව නිලධාරීන්ට ගෙවිය යුතුව තිබෙන ත්‍යාග මුදල් ගණනය කර වෙන්කිරීමක් කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු උසාවි දඩ මුදල් රු. 1,130,600 ක් අඩුවෙන් දක්වා තිබූ අතර නුවරඑළිය මහාධිකරණයෙන් ලැබිය යුතු හිග ආදායම් රු. 36,335 ක් දෙවරක් ගිණුම් ගතකර තිබුණි.

**(ඇ)** වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවකයන් තිදෙනෙකුට ගෙවන ලද රු 409,569 ක සේවක වේතන කැලෑ අරමුදලේ වියදමක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

**2.2.2** **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

--------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 4.5 සහ 4.6 වගන්ති අනුව නිලධාරීන් ස්ථිර සේවා ස්ථානයෙන් බැහැරව රාජකාරියෙහි යෙදවීමේදී යැපීම් දීමනා ලබාදිය යුතුව තිබුණද එයට පටහැනිව ආහාර හා නවාතැන් පහසුකම් වෙනුවෙන් රු.80,720 ක වියදමක් දරා තිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

--------------------------

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.19,583,876 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.19,286,799 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.297,077 ක වැඩි වීමක් නිරීක්ෂණය විය. අධිකරණ දඩ මුදල් ලැබීම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.1,415,381 කින් වැඩි වී තිබුණද ආරක්ෂණ වියදම්, වෙනත් ගෙවීම් සහ පුහුණු වියදම් පිළිවෙලින් රු.1,259,801 ක්, රු.302,734 කින් සහ රු.112,294 කින් වැඩි වීම ආදායමේ වර්ධනයට සාපේක්ෂව අතිරික්තය වර්ධනය නොවීමට බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

අපරාධ නීතිය ඉදිරියට පමුණුවනු ලබන වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ට සහ ඔත්තු සපයන්නන්ට ත්‍යාග මුදල් ලබාදීම, සාක්ෂිකරුවන්ට සහ වන නිලධාරීන්ට උසාවි ගමන් සඳහා වියදම් ගෙවීම සහ කැලෑ නිලධරයන්ට ස්වකීය කර්තව්‍යයන් කාර්යක්ෂමව කරගෙන යාම සඳහා පුහුණු වැඩ සටහන් පැවැත්වීම ඇතුළු වන සංරක්ෂණ කටයුතු කිරීමට වියදම් දැරීම අරමුදලේ මූලික අරමුණු වේ.

අරමුදලේ ආදායම් සහ වියදම් පිළිබඳව සලකා බැලීමේදී පසුගිය වර්ෂයේ ආදායමින් වැයකර තිබූ ප්‍රමාණය සියයට 38 ක් වන අතර සමාලෝචිත වර්ෂයේදී ආදායමින් වැයකර තිබූ ප්‍රමාණය සියයට 40 ක් පමණි. මේ පිළිබඳව තවදුරටත් පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වූයේ සෑම වසරකම ආදායමින් වැඩි ප්‍රමාණයක් වැය නොවීම නිසා එම මුදල් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබූ බවය.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) උසාවි මඟින් අයකරගත් මුදල් කැලෑ අරමුදලට බැර කිරීමට ප්‍රමාදවීමක් සිදුවී තිබූ අතර වර්ෂය තුළ එක් එක් මාසය සඳහා ලැබිය යුතු උසාවි දඩ මුදල් ආදායම් නිවැරදිව ගණනය කිරීම හෝ ඒ සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාවලියක් අනුගමනය කර නොතිබුණි.

(ආ) වන අපරාධ නඩු අවසන්ව ඇතත් එම වන අපරාධ වැලක්වීම සඳහා දායකවූ නිලධාරින් විසින් ත්‍යාග මුදල් ඉල්ලුම් කිරීමේ හා ඉල්ලුම් කළ ත්‍යාග මුදල් ලබාදීමේ ප්‍රමාදයන් වැලැක්වීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.

### 4.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ දිගුකාලීන රුපියල් ණය සුරකුම්වල ආයෝජනය කර තිබූ රු.2,300,000 ක මුදල 2015 ජුලි 01 දිනට කල්පිරී තිබුණු අතර මහ බැංකුව විසින් තැන්පතුව අවලංගු කර තිබුණද 2016 මාර්තු 31 දින දක්වාම මෙම මුදල නැවත ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සෑම වර්ෂයක් අවසානයේදීම ඉතිරි මුදල් එකතුවෙමින් 2015 වර්ෂය අවසාන වන විට රු.132,276,277 ක මුදල් ශේෂයක් පැවති අතර මෙම ඉතිරි මුදල් ප්‍රශස්ත ලෙස උපයෝජනය කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2015 වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

නීතිය ක්‍රියාත්මක කිරීමේ යෙදී සිටින නිලධාරීන්ගේ එම කාර්යය අගයමින් ප්‍රතිලාභ ලබාදීමේ ප්‍රධාන අරමුණින් පිහිටුවා ඇති කැලෑ දෙපාර්තමේන්තු අරමුදලෙන් ලබාදෙන ත්‍යාග ප්‍රදාන වැය පාලනයක් කිරීම තුළින් පාලනය කළ හැකි වියදමක් නොවුවද , සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 04 ක ඇස්තමේන්තු වියදම් සියයට 20 සිට සියයට 61 ක පරාසයක ඉතිරිවී පැවතුණි. ක්‍රමානුකූල වැය

පරිපාලනය කිරීම මෙම ඉතිරියට හේතුව ලෙස කළමනාකාරීත්වය දක්වා තිබුණද සෑම වර්ෂයකම සැලකිය යුතු ඉතිරියක් පැවතිම නිසා අයවැය ඇස්තමේන්තු නිවැරදි පදනමක් මත සිදු නොකරන බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වන සංරක්ෂක ජනරාල් වෙත වරින්වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ගිණුම්කරණය - වර්ෂයට අදාල ආදායම් සහ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීම.

(ආ) ආදායම් පාලනය - උසාවි මගින් අයකර ගන්නා ලද දඩ මුදල් අප්‍රමාදව දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට කටයුතු කිරීම.

(ඇ) මුල්‍ය පාලනය - අණපනතේ සඳහන් කරුණු වලට අනුගතව අරමුදලින් වියදම් දැරීම.